# සෙනෙහෙවන්ත මුව පැටියා



ඊ.එම්.ඩබ්.බී.චාතුර්යා කුමාරි ඒකනායක

කෘතියේ නම : සෙනෙහෙවන්ත මුව පැටියා

කතෘගේ නම : ඊ.එම්.ඩබ්.බී.චාතුර්යා කුමාරි ඒකනායක

කතෘ අයිතිය : ඊ.එම්.ඩබ්.බී.චාතුර්යා කුමාරි ඒකනායක

පාසල : මහමායා බාලිකා විදුහල

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය බී

කෘතිය පළ කරන දිනය : 2025-02-01

ෂීර්ජහ අංකය : 978-624-208-479-9



# පිදුම

මේ පොත ලියන්නට,

මා දිරිගන්වන ලද

මගේ ආදරණීය දෙමව්පියන්ටත් .....

මගේ ආදරණීය ගුරුතුමියටත්

සෙනෙහසින් පුද කර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතා කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක ලස්සන ගම්මානයක්
මැද පුංචි කැලෑවක් තිබුණා.
මේ කැලෑ ගමේ ලස්සන පුංචි මුව පවුලක්
ජීවත් වුණා.







චූටි මුව පවුලේ පුංචි මුව පැටියෙක් සිටියා. ඒ මුව පැටියා හරිම අහිංසකයි.



හැබැයි මේ පුංචි මුව පැටියා ටිකක් දඟකාරයි. ඉතින් මේ පුංචි මුව පැටියා එයාගේ ගෙවත්තේ සෙල්ලම් කරමින් සිටියා.



මේ සෙල්ලම් කරමින් හිටපු මුව පැටියා එයාගේ ගෙවත්තේ පඳුරක් සෙල වෙනවා දැක්කා. මෙයා හිමිහිට හිමිහිට ළඟට ගිහින් බැලුවා.




ඒ පඳුරට මුවාවෙලා හිටියේ එයා වගේම පුංචි හා පැටියෙක්. මේ පුංචි මුව පැටියාට හරිම සතුටක් දැනුණා.



මේ පුංචි මුව පැටියා මෙහෙම කල්පනා කළා."ආ.. මට දැන් සෙල්ලම් කරන්න යාළුවෙක් ඉන්නවා" කියලා. මේ පුංචි මුව පැටියා දුවගෙන ගිහින් එයාගේ අම්මටයි තාත්තටයි කිව්වා.





ඒ දෙන්නා මෙහෙම "කෝ පුතේ එක්කන් එන්නකො බලන්න ඔයාගේ අලුත් යාළුවාව" යැයි පැවසුවා.



මේ පුංචි මුව පැටියා දුවගෙන දුවගෙන ගිහින් ඒ පුංචි හා පැටියාව එක්කන් ආවා. මේ පුංචි පවුලට ආපු අලුත් සාමාජිකයාට හැමෝම කැමති වුනා. මේ පුංචි මුව පවුලට දැන් තවත් අලුත් සාමාජිකයෙක් එකතු වුණා.

ඔහොම ටික කාලයක් මෙයාලා ජීවත් වුණා. මේ පුංචි මුව පැටියයි හා පැටියයි සෙල්ලම් කරමින් හිටියා. ඈත ආකාසේ ලස්සන සරුංගලයක් කඩාගෙන යනවා මෙයාලා දුටුවා.






ඉතින් මේ පුංචි හා පැටියා මෙහෙම කිව්වා "මේ යාලුවේ අපි බලමු අර සරුංගලේ කොච්චර ලොකුද කියලා".
ඉතින් මේ පුංචි මුව පැටියා මෙහෙම කිව්වා" හපොයි මටනම් බෑ. අපේ අම්මා කියල තියෙන්නේ නොදන්න තැන්වල යන්න එපා කියලා."



ඉතින් මේ පුංචි හා පැටියා යලිත් වරක් මෙහෙම කිව්වා "මං මේ කැලෑවේ හැම තැනම දන්නව මගෙත් එක්ක යමු. බයවෙන්න දෙයක් නෑ." ඒ කතාවෙන් පසු මේ පුංචි මුව පැටියාට ආස හිතුණා. "හා අපි එහෙනම් යමු." මුව පැටියා පැවසුවා.




මෙයාලා ගෙදරටත් නොකියාම යන්න ගියා. මේ අතරතුරදි මිනිසුන්ගේ කට හඬක් ඇසෙන්න පටන් ගත්තා. මේ දෙන්නාට හොඳටෝම බය හිතුණා. මේ දෙදෙනා එතන තිබුණු විශාල ගසක් මුල වාඩි වී හඬමින් සිටියා.

"අපි දැන් මොකද කරන්නේ?" මුව පැටියා හා පැටියාගෙන් ඇසුවා. ඔහොම ටික වෙලාවක් යනකොට රෑ බෝ වෙන්න පටන් ගත්තා. ඉතින් දැන් මේ දෙන්නට පාරත් හොයාගන්න අමාරුයි. මෙයාලා හොඳටම අඬ අඬා එතනටම වෙලා සිටියා.





මුව අම්මයි තාත්තයි හොඳටෝම බය වෙලා මේ දෙන්නව හොයන්න පටන් ගත්තා. කැලෑවේ ටික දුරක් ඇවිදන් යනකොට අඬන සද්දයක් ඇහිලා අම්මා එතනට ගිහින් බලන විට මුව පැටියයි හා පැටියයි සිටියා. දෙන්නටම අම්මාව දැකලා ගොඩක් සතුටු හිතුණා.



ඉතින් පුංචි යාළුවනේ අපි හැමෝටමත් මේක හොඳ පාඩමක්. අපේ දෙමව්පියන් වැඩිහිටියන් ගුරුවරු එපා කියන කිසි දෙයක් කරන්න යන්න එපා. මොකද අපි තාම පුංචි නිසා ඒ හැමදේම එයාලා අපිට කියන්නේ අපිව ආරක්ෂා කරන්න සහ අපිට ආදරේ නිසා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්